// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2209/17 - 2021 ජනවාරි මස 05 අඟහරුවාදා - 2021.01.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත**

3 වැනි වගන්තිය යටතේ නියෝගය

2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනතේ 3 වැනි වගන්තියේ (3) උපවගන්තිය යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියෝගය මගින් 2020 මැයි මස 26 දිනැති අංක 2177/4 සහ 2020 ඔක්තෝබර් මස 23 දිනැති අංක 2198/57 දරන ගැසට් නිවේදන දෙකෙහි 2 වන ඡේදයේ (ක) සහ (ඛ) උපඡේද පහත පරිදි සංශෝධනය කොට ආදේශ කරමි.

"(ක) ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමනය යන විෂය අයත් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතියට යටත්ව ඖෂධ නිෂ්පාදකයන් විසින් ඖෂධ නිෂ්පාදනය සඳහා ආනයනය කරනු ලබන අමුද්‍රව්‍ය සහ ඇසුරුම් ද්‍රව්‍ය"

"(ඛ) ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමනය යන විෂය අයත් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතියට යටත්ව ඖෂධ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ඖෂධ නිෂ්පාදකයින් විසින් ආනයනය කර ඖෂධ නිෂ්පාදනය සඳහා භාවිතා කරනු ලබන උපාංග හා අමතර කොටස් ඇතුළත්ව යන්ත්‍රෝපකරණ සහ උපකරණ"

මෙම නියෝගය 2021 ජනවාරි මස 05 වැනි දින සිට බලපැවැත්වේ.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2021 ජනවාරි මස 05 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

01 - 350

1A - PG 5255 — 575 (2021/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*